# තුන්වෙනියාමයේ මාස්ටර්ගෙ සංගීතය මගේ සංගීතයට වඩා හොඳ නිසා මං සම්මානය බාරගත්තෙ නැහැ

## හෘදසාක්ෂියට මුල් තැන දුන් අභීත සංගීතඥයා එච් එම්



### එච්.එම්. ජයවර්ධන

*හෙළ ගී අම්බරයේ නොමැකෙන ලෙස සිය නම සටහන් කරන්නට වාසනාව ලද සංගීතඥයන් අතළොස්ස අතරින් අයෙකි එච්.එම්. ජයවර්ධන. නන්දා මාලිනී ගයන 'ඔබයි රම්‍ය සඳ කිරණ', 'නවාතැන්පොල ඔබයි ඔබගේ සිනාවයි', 'මධුර ප්‍රේම කල්පනා', අමරදේව ගයන 'සඳ තරු නිහඬයි', ටී.එම්. ජයරත්න ගයන 'රත්තරන් නෙත් දෙකින්', 'සියක් ආයු ලැබ', මාලිනී බුලත්සිංහලගේ 'මා එක්කලා අමනාපව', 'ඔබට මා ආදරය කළ බව මෙතරම්', 'රජ මැදුරක ඉපදී සිටියානම්', කරුණාරත්න දිවුල්ගනේ ගයන 'සගවන්න එපා හසරැල්', 'මාල ගිරව්යේ', අමරසිරි පීරිස් ගයන 'ඇය යන්න ගියා මැකිලා', රෝහණ සිරිවර්ධනගේ 'දේව මන්දිරේ' ඔහු විසින් එදා මෙදා තුර සංගීත නිර්මාණය කළ සිය ගණනක් ගී අතරින් කීපයකි. මොණරාගල දිස්ත්‍රික්කයේ ඈත කෙළවරේ පිහිටි අදටත් පිටිසර සහ දුෂ්කර ප්‍රදේශයක් වන සියඹලාණ්ඩුව ග්‍රාමයේ එච්.එම්. උපත ලැබන්නේ 1950 වසරේ මාර්තු 17 වෙනිදාය. ඒ වෘත්තියෙන් ගොවියෙකු වූ හේරත් මුදියන්සේලාගේ විජේසුන්දර සහ එම්.ඩී.ඇම්. රම්මැණිකා යුවළගේ කුළුදුල් දරුවා ලෙසනි. සියඹලාණ්ඩුව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලද එච්.එම්. හය වසරේදී ඉන් සමුගත්තේ සියඹලාණ්ඩුව විද්‍යාලයෙන් පහේ ශිෂ්‍යත්වය සමත් වූ ප්‍රථම ශිෂ්‍යා ලෙස වාර්තාවක් තබමිනි. ශිෂ්‍යත්වය සමත්වීම නිසා රජයෙන් ආධාර මුදලක්ද ලබාගනිමින් ඌව පළාතේ ප්‍රමුඛ විද්‍යාලයක් වන පස්සර මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට ඔහුට වරම් ලැබිණ. එච්.එම්.ගේ ජීවිත ගමනේ සුවිශේෂී හැරවුමක් සිදුවූයේ පස්සර මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් සිටින අතරේය. පන්තියේ විෂයක් ලෙස සංගීතය හදාරන්නට ඔහුට අවස්ථාවක් නොලැබුණද විද්‍යාලයේ සංගීත ගුරුවරයා යටතේ හවස පුහුණුවීම් පන්තිවලට සහභාගි වී සංගීතය ඉගෙනගැනීමට ඔහුට ඉඩ ලැබිණ. එහිදී ඔහුගේ සිත්ගත් සංගීත භාණ්ඩය වූයේ බටනලාවය. පසුව ගුවන් විදුලි සංස්ථා සංගීත අංශයේ බටනලා වාදකයකු ලෙස රැකියාවක් සොයා කොළඹ එන එච්.එම්. කාලයාගේ ඇවෑමෙන් හෙළ සංගීත ක්ෂේත්‍රයේ සුවිශේෂී අනන්‍යතාවයක් සටහන් කරන්නේ තනු නිරමාපකයකු සහ සංගීත අධ්‍යක්ෂවරයකු ලෙසිනි. එදා මෙදා තුර ඔහු අතින් සංගීත නිර්මාණය කෙරුණු සිය ගණනක් ගී අතරින් සැළකිය යුතු සංඛ්‍යාවක් සම්මානයට පාත්‍රවිය.*

*පසුගිය දිනෙක 'සන්නස' සංවාදය වෙනුවෙන් මම ඔහු සොයා ඔහුගේ අලුත්ම නවාතැන්පොළ වෙත ගියෙමි. දැන් ඔහු පදිංචිව සිටින්නේ කොළඹ අවිස-සාවේල්ල 122 මාර්ගයේ ගොඩගම හන්දිය පෙනෙන මානයේ පොල්වත්තක් මැද පිහිටි දෙමහල් නිවෙසක ඉහළ මාලයේය. ඔහුගේ දුරකථන අංකය 077 3064873 යි.*

**ඔබගේ පදිංචිය ආයෙත් වෙනස්වෙලා. ජීවිතයේ සැන්දෑ යාමයේ කොළඹින් සෑහෙන දුරක ගොඩගම වගේ ප්‍රදේශයක් පදිංචියට තෝරගත්තේ ඇයි?**

රාජගිරියේ ගෙදර විකුණුවා. ඒ පරිසරය මටයි කසුන්ටයි ඒතරම් සෙට් වුණේ නෑ. ඔය අතරේ කසුන්ට සල්ලි ප්‍රශ්ණයක් ආවා. මම කිව්වා එහෙමනම් ගේ විකුණමු කියලා. ඒ ගෙදර විකුණල දැන් අවුරුදු දෙකක් විතර වෙනවා. ඊට පස්සේ ගොඩගමට හැතැප්ම දෙකක් විතර ඈතින් හම්බවුණ ගෙදරක තමයි හිටියේ. එතන දුර වැඩි නිසා මට පාරකට කිට්ටුව ගෙයක් හොයලා දෙන්න කියලා යාලුවෙකුට කිව්වාට පස්සේ මෙතන හොයලා දුන්නා. ගොඩගම හන්දියෙමනේ. අනික මෙතන හොදට නිදහස් වටපිටාවක් තියෙන්නේ. ඒ නිසා මාර්තු පලවෙන-දා මෙහෙ පදිංචියට ආවා.

**මේ විදිහට කාලයෙන් කාලයට පදිංචියේ සිද්ධ වෙන වෙනස්වීම් සංගීතවේදියෙක් විදිහට ඔබේ වෘත්තීය ජීවිතයට බලපාන්නේ නැත්ද? දැන් ඒ කටයුතුවලින් ඉවත්වෙලාද ඉන්නේ?**

කොළඹ ආව දා ඉදලා මගේ පදිංචිය සැරෙන් සැරේ වෙනස් වුණා. ඒත් මගේ වැඩවලට ඒක බාධාවක් කරගත්තේ නෑ. කොළඹ ඇවිල්ලා මුල් කාලේ යාලුවන්ගේ ගෙවල්වල නැවතිලා හිටියා. බැන්දට පස්සේ බොරලස්ගමුවේ මාලිනිල ගෙදර කාලයක් හිටියා. කුළියට ගෙවල් අරගෙන හිටියා. පස්සේ තමයි රාජගිරියේ ගෙදරක් හැදුවේ. ඔය කොහෙ හිටියත් මගේ වැඩ ඒ

සටහන සහ ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න

විදිහටම කරගෙන ගියා. දැනුත් එහෙමයි. සංගීත නිර්මාණයක් කරගන්න කවුරු හරි මාව හොයාගෙන ආවොත් ඒක කරලා දෙනවා. සෙන-සුරාදාට තවත් ගුරුවරු කීප දෙනෙකුත් සම්බන්ධ කරගෙන සියළුම විභාගවලට සංගීත පන්තියක් පවත්වනවා.

**සංගීත නිර්මාණකරුවන් අනෙකුත් බොහෝ කලා ශිල්පීන්වගේ රසිකයන් හා නිතර මුහුවන පිරිසක් නෙවෙයි. ඔවුන්ට තියෙන්නේ එක්තරා ආකාරයක හුදකලා ජීවිත. කොහොමද මේ වගේ වෘත්තියකට ඔබ යොමුවෙන්නේ?**

පස්සර මධ්‍ය මහා විද්‍යාලේ ඉගෙන ගන්න කාලේ තමයි මියුසික්වලට මුලින්ම මට ආශාවක් ඇතිවෙන්නේ. ඒ කාලේ අපේ ගම් පළාත්වල සංගීතය කියන දේ ප්‍රචලිත දෙයක් නෙවෙයි. අද වගේ ගෙවල්වල රේඩියෝ තිබුණේ නෑ. එකම රේඩියෝවක් තිබුණා ගමේ කඩේක. ඉතිං හවසට අපි ශිෂ්‍යත්ව පන්තිවලට යන එනකොට ඕක ඇහෙනවා. එච්චරයි. පස්සර ආවට පස්සේ නිතර රේඩියෝව අහන්ඩ ලැබුණා. අපේ හොස-ටල් මාස්ටර්ගේ කාමරේ නිතරම රේඩියෝ එක දාල තියනවා. ඒ කාලේ මට මතකයි රන්මුතු දූව චිත්‍රපටියේ 'ගලන ගගකි ජීවිතේ' සින්දුව එහෙම රේඩියෝ එකේ යනවා. ඉතිං මට ඒවට ලොකු අශාවක් ඇතිවුණා. ඉස්කෝලෙන් බටනලාව පිඹින්න පුරුදු වුණා. ඉස්කෝලෙන් අස්වෙලා ගුවන් විදුලි සංස්ථාවේ වාදක මණ්ඩලේ රස්සාවක් හොයාගෙන ආවා. බොහොම අමාරුවෙන් ඒක ලැබුණා. ඒ ඉන්න අතරේ තමයි තනු නිර්මාණය කරන්න අවස්ථා ලැබුණේ. මුලින්ම කළ ගීත කීපයක් ජනප්‍රිය වුණාට පස්සේ මට දිගටම ගීත ලැබෙන්න පටන් ගත්තා.

**ගුවන් විදුලි සංස්ථා වාදක මණ්ඩලයට බැදෙන්න අමාරු වුණේ ඇයි?**

ඉස්කෝලෙන් අස්වුණාට පස්සේ මම යාලුවෝ මුණ ගැහෙන්න ඉදලා හිටලා පස්සර යනවා. අහම්බෙන් වගේ දවසක් මට යාළුවන්ගෙන් දැනගන්න ලැබුණා ගුවන් විදුලි සංස්ථා වාදක මණ්ඩලයට අනියම් පදනමෙන් ශිල්පීන් බදවාගන්නව කියලා. පස්සේ ඉල්ලුම් කළා. පරීක්ෂණයට එන්න කියලා දිනයක් දන්වලා මට ලියුමක් ලැබුණා. ඒ වෙනකොට මම කවදාවත් කොළඹ ගිහිල්ලා තිබුණේ නෑ. අමාරුවෙ-න් බස් කුලියත් හොයාගෙන මම කොළඹ ආවා. ඒ වෙනකොට මම දන්න කීප දෙනෙක් කොළඹ හිටියා. ඒ අය ළග නැවතිලා කොහොම හරි මම සම්මුඛ පරීක්ෂණයට ගියා. පරීක්ෂණයේදී ස්වර ප්‍රස්ථාර කියවන්න ඕනේ. වාදනය කරන්න ඕනේ. මම දන්න විදිහට කළා. නමුත් ඒකෙන් සාර්ථක ප්‍රතිපයක් ලැබුණේ නෑ. හැබැයි මට වාදකයෙක් විදිහට ගුවන් විදුලියට බැදෙන්න ලොකු ඕනේ කමක් දැනුනා. පස්සේ මගේ යාලුවෙක් හිටියා පස්සර මන්ත්‍රී සෝමපාල. මිනිහා ශ්‍රාවස්ථියේ නැවතිලා හිටියේ. මම ගිහිල්ලා එයාට කිව්වා වෙච්ච දේ. හරි මම ඕක කරලා දෙන්නම් උඹ ටික දවසක් මෙහෙට වෙලා හිටපන් කියලා එයා මාව ශ්‍රාවස්තියේ නවත්ත ගත්තා.

පස්සේ ඌව පළාතේ මන්ත්‍රීවරු ඔක්කොම අස්සන් කරලා මට ලිවුමක් දුන්නා. ඒ කාලේ ගුවන් විදුලියේ වාදක මණ්ඩලේ නායකයා හිටියේ සෝමදාස ඇල්විටිගල. මම මේ ලිවුම ගහිල්ලා එයාට දුන්නා. එයා මේක ගනනකට ගත්තේ නෑ. පිස්සුද මන්ත්‍රීලගේ ලියුම්වලට මම රස්සාවල් දෙන්නේ නෑ කියලා කිව්වා. මම ඇහුවා ඉතිං සර් මොකක්ද මගේ තියන අඩුපාඩුව කියලා. නෑ ඉතිං ඔයාට අපි දෙන ස්වර ප්‍රස්ථාරේ හරියට කියවගන්න බෑනේ ළමයා අරෙහෙ මෙහෙ කියලා කිව්වා. ඒ වෙනකොට ඇත්තටම සින්දු වාදනය කළා වුණාට ස්වර කියවගන්න හොඳ දැනුමක් මට තිබුණේ නෑ.

පස්සේ ඉතිං කොළඹ යාලුවන්ගේ ගෙවල්වල නැවතිලා ඉදලා අහම්බෙන් මට හිතුනා අමරදේව සර් හම්බවෙන්න යන්න කියලා. ඒ දවස්වල එයා හිටියේ රත්මලානේ බොරුපොන. ඒ වෙනකොට එයා ගුවන් විදුලියේ සංගීත අංශය බාරව වගේ වැඩ කළා. හම්බවෙලා මම කිව්වා සර් මම අම්පාර පැත්තේ ඉදලා ආවේ. මෙහෙම ප්‍රශ්ණයක් තියනවා උදව් කරන්න පුළුවන්ද කියලා. එහෙම නම් සින්දුවක් ප්ලේ කරලා පෙන්නන්න කියලා කිව්වා. මම වික්ටර් අයියගේ සිහිල් සුළං රැල්ලේ සින්දුව බටනලාවෙන් වාදනය කළා. නෑ ඉතිං ඔයාට හොදට ප්ලේ කරන්න පුළුවන්නේ. ප්‍රශ්ණයක් නෑනේ. ස්වර කියවන්න පුළුවන්ද කියලා ඇහුවා. ඒ ගැන එච්චර දැනීමක් නෑ කියලා මම කිව්වාම ස්වර ටිකක් ලියලා කියවන හැටි කියලා දුන්නා. හෙට මම ඉන්නවා ගුවන් විදුලියේ ඇවිල්ලා මාව හම්බුවෙන්න කියලා කිව්වා.

ඒ වෙනකොට පස්සර සෙන්ට්‍රල් එකේදි මට ඉතිහාසය උගන්නපු වසන්ත ඔබේසේකර සර් හිටියේ බම්බලපිටියේ ලොරිස් රෝඩ් එකේ. එයා හොඳ ගිටාර් ප්ලේයර් කෙනෙක්. මම එයාවත් හම්බවෙලා මේ ප්‍රශ්ණේ කිව්වා. හා ඕක ඒ හැටි ප්‍රශ්ණයක් නෙවෙයිනේ. ඕකේ ඉන්න මිස්ටර් ඇල්විටිගල මගේ හොඳ යාලුවනේ කියලා මට ලිවුම් කෑල්ලක් ලියලා දුන්නා මේ එන්නේ මගේ කොල්ලෙක් මෙයාව කොහොම හරි දාගන්න කියලා. මගේ හිතේ ඒ වෙනකොට වසන්ත සර්ගේ සත් සමුදුර හරි මොකක් හරි ෆිල්ම් එකක සංගීතය අධ්‍යක්ෂණය කරලා තිබුණොත් සෝමදාස ඇල්විටිගල. ඒ ලිවුමත් අරගෙන ගිහින් එයාට දුන්නා. අමරදේව මාස්ටරුත් හිටියා. තමුසේ කියන්න එපායැ මේගොල්ල අඳුරනවා කියලා. එනවා එනවා හෙට ඉදලා වැඩට එනවා කියලා ලිවුම බැලුව ඇල්විටිගල කිව්වා.

**ඉස්කෝලෙදි සංගීතය වැඩිය ඉගෙන ගන්න අවස්ථාවක් ලැබුණේ නැත්ද ඒ විදිහට ස්වර ප්‍රශ්ථාර කියවගන්න බැරිවුණේ?**

ඉස්කෝලෙදි මම සංගීතය විෂයක් විදිහට කළේ නෑ. හොස්ටල් එකේ හිටයා කිරිවන්ත කියලා ළමයෙක්. එයා ජපන් මැඩලින් එක, බටනලාව හොදට වාදනය කරනවා. වතාවක් නිවාඩුවට ගෙදර යන ගමන් මම ශත පනහක් දීලා එයාගෙන් බටනලාවක් ඉල්ලන් ගියා. ගමේ ඉන්න අතරේ නිකන් හිතට එන දේවල් බටනලාවෙන් වාදනය කළා. ස්වර ගැන කිසිම දැනීමක් ඒ කාලේ තිබුණේ නෑ. නිවාඩුව ඉවරවෙලා ආපහු හොස්ටල් එකට ආවට පස්සෙත් මම ඒ විදිහට බටනලාව වාදනය කළා. හැබැයි අනෙක් අයට පෙනෙන්නේ නැති වෙන්න බාත්රූම් එකට ගිහිල්ලා තමයි බටනලා වාදනය කළේ. අනික් අයට පේන්න වාදනය කරන්න පොඩි කුලෑටිකමක් තිබුණා. අපි බාරව නේවාසිකාගාරයේ හිටියේ සුබසිංහ කියලා සර් කෙනෙක්. ඒ සර් දවසක් කිව්වා ඔහොම හරියන්නේ නෑ ළමයෝ හවස තියන සංගීත පන්තියට එන්න මම ඔයාට පොඩ්ඩක් කියලා දෙන්නම් වාදනය කරන්න කියලා. හවස පන්තියේදි සර් මූලික ස්වර එහෙම ඉගැන්නුවා. පස්සේ ගීත වාදනය කරන්න පුළුවන්, ස්වර කියවන්න පුළුවන් තත්ත්වෙට ආවා. සමස්ථ ලංකා තරගවලට එහෙමත් සර් එක්ක සහභාගි වුණා. ඒ වෙනකොට හතේ අටේ පන්තිවල වගේ හිටියේ. ඒ වුණාට වාදක මණ්ඩලයක ප්ලේ කරද්දි වුවමනා වෙන මට්ටමෙන් ස්වර කියවන්න පුළුවන්කමක් මට තිබුණේ නෑ.

**ඔබ පස්සර සෙන්ට්‍රල් එකට එන්නේ ශිෂ්‍යත්වයක් ලබාගත්ත දක්ෂ ළමයෙක් විදිහට. ඒකෙන් යන්නේ සාමාන්‍ය පෙළත් අසමත් ළමයෙක් විදිහට. ඇයි ඒ විදිහට අධ්‍යාපනය කඩවැටෙන්නේ?**

මම හිතන්නේ සංගීතය පැත්තට මම වැඩිපුර බරවුණ නිසා වෙන්න ඇති. ශිෂ්‍යත්වෙ පස්වෙලා පස්සර මධ්‍ය මහා විද්‍යාලයට එනකොට මට වයස අවුරුදු දහයයි. සියඹලාන්ඩුව මහ විද්‍යාලයෙන් මුලින්ම ශිෂ්‍යත්වය පාස් වුණ ළමයා මම. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් අටක් ද කොහෙද තිබුණා.



මම පාස් වුණේ විෂයන් තුනයි. ඒකෙන් මට ලැබිලා තිබුණු ශිෂ්‍යත්වෙත් කැන්සල් වුණා. මට ආපහු ගෙදර යන්න සිද්ධ වුණා. ඉංග්‍රීසි, භූගෝලය වගේ